# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 83/7 — 1980 අප්‍රේල් 10 වැනි බ්‍රහස්පතින්ද — 1980.04.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී—බී 21/78.

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියමාවලිය.

ඩබ්ලිව්. එම්. ඒ. විජේරත්න බණ්ඩා,
ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1980 මාර්තු මස 28 වන දින,
කොළඹ දී ය.

### නියමාවලිය

1. මෙම නියමාවලිය 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1980 අප්‍රේල් මස 10 වන දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

2. පනතේ 18 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද, 1979 මැයි මස 28 වන දින අංක 38/2 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ, 1979 අංක 2 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය, එකී නියමාවලිය යටතේ මීට ඉහත දී කරන ලද කිසිදු ක්‍රියාවකට හානියක් නොවන පරිදි මෙයින් ඉවත් කරනු ලැබේ.

3. මෙම නියමාවලිය ක්‍රියාත්මක වූ විට (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද විද්‍යා පශ්චාත් උපාධි ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් මෙම නියමාවලියෙහි විධිවිධාන යටතේ පිහිටුවනු ලැබිය යුතු ය.

4. (මෙහි මින්මතු "විශ්ව විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයට මෙම ආයතනය අනුයුක්ත කරනු ලැබිය යුතු ය.

5. පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානයන්ට හා කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍යවලට යටත්ව, ආයතනයට පහත සඳහන් කටයුතු කිරීමට බලය ඇත්තේ ය—

(අ) ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීම;

(ආ) ආයතනයේ සහ විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කොට ඇත්තේ වෛද්‍ය විද්‍යාවේ යම් විශේෂ ක්ෂේත්‍රයන් ද, ඒ විශේෂ ක්ෂේත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි තත්ත්වයේ ඉගැන්වීම, පුහුණුවීම සහ පර්යේෂණ කිරීම සඳහා කටයුතු සැලැස්වීම ;

(ඇ) විශ්ව විද්‍යාලයේ අනුමතයත්, කොමිෂන් සභාවේ එකඟත්වයත් ඇතිව, වෛද්‍ය විද්‍යාවේ විවිධ විශේෂ ක්ෂේත්‍රයන්හි ප්‍රදානය කළයුතු පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා නිශ්චය කිරීම;

(ඈ) වෛද්‍ය විද්‍යාවේ විවිධ විශේෂ ක්ෂේත්‍රවල ප්‍රවීනත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විශ්ව විද්‍යාලයේ අනුමතය ඇතිව පශ්චාත් උපාධි විභාග පැවැත්වීම සහ එම විභාග මඟින් සාමර්ථ්‍යය ලබා විශ්ව විද්‍යාලය විසින් ආයතනය විමසීමෙන් පසු සාදනු ලැබිය හැකි අතුරු ව්‍යවස්ථා මගින් නියම කරන ලද වෙනත් කොන්දේසි සපුරාලීමෙන් පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්ව විද්‍යාලයට නිර්දේශ කිරීම;

(ඉ) ආයතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ පිටරට වෙනත් විශ්ව විද්‍යාල හෝ ආයතන සමඟ ආචාර්යවරයන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඊ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි පරිදි, ආයතනයට ඇතුල්වීමට අපේක්ෂා කරන තැනැත්තන් හෝ ආයතනයේ ශිෂ්‍යයන් විශ්ව විද්‍යාලවල දී හෝ විශ්ව විද්‍යාල මට්ටමේ අධ්‍යාපන ආයතනවල දී සාමර්ථ්‍යය ලත් විභාග හා ගත කළ අධ්‍යයන කාල සීමාව, ආයතනයේ